# නියැදි ප්‍රශ්න - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂිත නිපුණතා අංක 1 ඇගයීම් පරීක්ෂණය (සිවිල් ඉංජිනේරු ප්‍රායෝගික කුසලතා)

1 වන ප්‍රශ්නය

බාහුවේ කෙළවරට කුල්ලක් සවි කර ඇති, හයිඩ්‍රොලික් කැණීම් යන්ත්‍ර වගර්යේ නම කුමක් ද?

1. බැකෝ යන්ත්‍රය
2. බුල්ඩෝසරය
3. තලන යන්ත්‍රය
4. ගල් රෝල

පිළිතුර: 1

2 වන ප්‍රශ්නය

දියකඩනයන් සහ ඉවුරු ඉදිකකරන අවස්ථාවල දී භාවිතා කරන, රීබාර් යෙදූ කොන්ක්‍රීට් පෙට්ටිවල නම කුමක් ද?

1. රැලි මඩර්න බ්ලොක්
2. කේසන් (ජලවාරක)
3. නැංගුරම
4. ක්ලබ් බකට් එක

පිළිතුර: 2

3 වන ප්‍රශ්නය

ගේට්ටු හැඩැති ගොඩනැගිලි රාමු වටා ජැක්, හරස් බාර් සහ වානේ බිම් පුවරු වැනි මූලික කොටස් එකලස් කරන පලංචි වර්ගයේ නම කුමක් ද?

1. කූඤ්ඤ බන්ධන පලංචි
2. තනි නල පලංචි
3. රාමු පලංචි
4. පලංචි පාද පුවරුව

පිළිතුර: 3

## 4 වන ප්‍රශ්නය

ඉහළ කොටසට පදය තබා බිම හාරන අසිපතක හැඩැති සවල කවරේ ද?

1.
2.
3.
4.













පිළිතුර: 1

5 වන ප්‍රශ්නය

පින්තූරයේ දැක්වෙන යන්ත්‍රයේ නම කුමක් ද?

1. අත් මික්සරය
2. සල්ලඩය
3. දිග මනින ස්වයං එතෙන ටේප් එක
4. කොන්ක්‍රීට් මික්සරය



පිළිතුර: 4

6 වන ප්‍රශ්නය

ප්‍රවාලන උමං ඉදිකිරීමේ දී, ඉදිකිරීම් ආරම්භක ස්ථානය පැත්තෙන්, උමගේ පාදම සහ පොළොව මතුපිට එකට සම්බන්ධ කෙරෙන ලෙස ඉදිකරනු ලබන කොටස කුමක් ද?

1. පතල් උමඟ
2. ප්‍රවාලන උමඟ
3. සිරස් උමඟ
4. තිරස් උමඟ

පිළිතුර: 3

7 වන ප්‍රශ්නය

ළිංතාන ඉදිකිරීම යනු කුමන වගර්යේ ඉදිකිරීම් ද?

1. භූගත ජල මට්ටම පහත හෙළීම සඳහා කෙරෙන ඉදිකිරීම් කායර්
2. ගංගා ජලය පිරිසිදු කිරීම සඳහා කෙරෙන ඉදිකිරීම් කායර්
3. පස පිරිසිදු කිරීමේ කායර්
4. පස් සහ වැලි ඉවත් කිරීමේ කායර්

පිළිතුර: 1

8 වන ප්‍රශ්නය

ළිං කැණීමේ කාර්යයේ දී, කුහරය හරහා විදුලි ධාරාවක් ගමන් කරවා, ජලය ලබා ගැනීමට එම ස්ථරය සුදුසු දැයි පරීක්ෂා කිරීම හඳුන්වන්නේ කෙසේ ද?

1. විදුලි ස්ථර පරීක්ෂාව
2. විද්‍යුත් ප්‍රතිරෝධය
3. විදුලි සංදේශය
4. විදුලි කාන්දු විමශර්නය

පිළිතුර: 1

9 වන ප්‍රශ්නය

නිම කල මාගර් ව්‍යුහයක, නිමා කිරීමේ ස්ථරයට පහතින් ඇති කොටස කුමක්ද?

1. මතුපිට ස්ථරය
2. මූලික ස්ථරය
3. මාගර්යේ පාදම
4. මාගර් බිම

පිළිතුර: 4

10 වන ප්‍රශ්නය

පහත වාක්‍යයේ ( ) තුලට යෙදෙන කොටස තෝරන්න.

සිවිල් ඉංජිනේරු කටයුතුවල දී සුලභ අනතුරු වන්නේ “උඩින් වැටීම/ බිමට වැටීම”, “( )”, “හසු වීම, පැටලී ඇදී යාම” වේ.

1. විසිවී යාම/ ඉහලින් වැටීම
2. හැප්පීම
3. විනාශ වීම/ කැඩී වැටීම

පිළිතුර: 3

11 වන ප්‍රශ්නය

පහත වාක්‍යයේ ( ) තුළට යෙදෙන කොටස තෝරන්න.

උස් ස්ථානවලින් වැටීම, ඉදිකිරීම් අතරතුර උඩ තට්ටුවකින් හෝ භාරන වලවල් ආදියට වැටීම හේතුවෙන් සිදුවන වෘත්තීය අනතුර කුමක් ද?

1. උඩින් වැටීම/ බිමට වැටීම
2. පෙරලී වැටීම
3. හැප්පීම

පිළිතුර: 1

12 වන ප්‍රශ්නය

පහත වාක්‍යයේ (            ) තුළට යෙදෙන කොටස තෝරන්න.

සමතුලිතතාවය නැතිවීම හෝ ලිස්සා යාම හේතුවෙන් වැටීමේ අවස්ථා බොහොමයක් සිදු වන බැවින්, උස් ස්ථානවල දී (            ) නියමාකාර ලෙස පැළඳිය යුතුය.

1. කායර් අත්වැසුම්
2. ෆුල් හානර්ස් පටි වගර්යේ වැටීම වැළැක්වීමේ උපකරණ

පිළිතුර: 2

13 වන ප්‍රශ්නය

පහත වාක්‍යයේ ( ) තුලට යෙදෙන කොටස තෝරන්න.

ඉදිකිරීම් ස්ථානවල සිදුවන මාරාන්තික අනතුරු වලින් අඩකට ආසන්න ප්‍රමාණයක් අළුතින් ඇතුළු වී ( ) සිදු වී ඇත.

1. දිනයක් ඇතුළත
2. සතියක් ඇතුළත
3. මාසයක් ඇතුළත

පිළිතුර: 2

14 වන ප්‍රශ්නය

පහත වාක්‍යයේ ( ) තුළට යෙදෙන කොටස තෝරන්න.

තාප ආඝාතයට පිලියමක් ලෙස, නියමිත විවේක වේලාවන් තුළ ඔබ විවේක ගත යුත්තේ කොතැන ද?

1. හිරු එළිය වැටෙන ස්ථානයක
2. උණුසුම් ස්ථානයක
3. සිසිල් තැනක

පිළිතුර: 3